ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

**අන්තර්ජාතික නීතිය – LWU 3315 / 4312 / 4335**

කාලය - පැය තුනයි

---

දිනය 2007 මාර්තු මස 26 වන දින        වේලාව පෙ ව 9.30 ප ව 12.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. බෙනිටෝ වාවේස් පිජ්සිස් එක්සත් ජනපදයේ සහ සමාජවාදී බෙන්වර් ජනරජයේ ද්විත්ව පුරවැසිභාවය දරන කුප්‍රකට ආයුධ හා මත්ද්‍රව්‍ය වෙළෙන්දෙකි. ඔහු 1975 සිට පිජ්සිස් එක්සත් ජනපදයේ පදිංචිව සිටී. 2005 දී බෙනිටෝ යුද්ධයකින් පීඩා විඳින පර්ල් දිවයිනේ පුරවැසියකු වූ තම මස්සිනා වන කර්ම සමග එක්ව පර්ල්හි වෙනම රාජ්‍යයක් සඳහා යුද වැදී සිටින ත්‍රස්තවාදී සංවිධානයට බෙන්වර් සිට ගුවන් යානා නාශක මිසයිල ප්‍රවාහනය කිරීමට උත්සාහ දැරිය. ඔවුන් විසින් මිසයිල 15 ක් මිල දී ගනු ලැබූ අතර බෙනිටෝ ඒවා නාඩා රාජ්‍යයට ගෙන ඒමට සමත් විය. නාඩා රාජ්‍යයේ සිට ඒවා ත්‍රස්තවාදී සංවිධානයට භාර දීමට නියමිතව තිබුණි. නාඩා රාජ්‍යයේ ආරක්ෂක බලධාරීහු බෙනිටෝ හා ත්‍රස්ත සංවිධානයේ නියෝජිතයන් දෙදෙනෙකු නීති විරෝධී ලෙස ආයුධ ප්‍රවාහනය කිරීමේ චෝදනාව මත අත් අඩංගුවට ගත්හ.

   මේ අතර පිජ්සිස් එක්සත් ජනපදයේ සිටි කර්ම, පොලිසිය තමන් පසුපස ලුහුබඳින බව දැන පලා යාමටත් තම මස්සිනා බේරා ගැනීමටත් පිඹුරුපත් සැකසීය. කර්ම බියාමි රාජ්‍යයට ඇතුළුවීම සඳහා වීසා බලපත් ලබා ගැනීම පිණිස ව්‍යාජ ලියකියවිලි සැදුවේය. බියාමි කරා පියාසර කරමින් සිටිය දී බියාමි ගුවන් සේවයට අයත් අංක 85 දරණ ගුවන් යානය පැහැරගත් කර්ම යානය නාඩාහි බටහිර දේශ සීමාව ආසන්නයේ ගොඩ බස්වන ලෙස බල කළේය. 105 දෙනෙකුගෙන් සමන්විත වූ ගුවන් මගීන් හා යානාවේ කාර්ය මණ්ඩලය ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා ගත් ඔහු බෙනිටෝ හා ත්‍රස්ත නියෝජිතයන් වහාම නිදහස් කරන ලෙස හා හෙළි නොකරන ලද ස්ථානයකට ආරක්ෂා සහිතව යාමට තමාට අවස්ථාව සලසා දෙන ලෙසට බල කළේය. බලධාරීන් සමග සාකච්ඡා සාර්ථක වීමෙන් පසුව කර්ම විසින් ගුවන් යානය ප්‍රාණ ඇපකරුවන් සමග නිදහස් කරන ලද නමුදු ඔහු පැනගොස් යාබද කපිස්ථාන් දේශයට ඇතුළු විය. එහි දී ඔහු දේශපාලන රැකවරණ පැතීය

   දී ඇති සිද්ධියේ අඩංගු අධිකරණ බලය පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න. සැකකරු සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍යයන්ට වඩා තමනට අධිකරණ බලය ඇත්තේ යැයි කිව හැක්කේ කුමන රාජ්‍යයට දැ යි යෝජනා කරන්න. ඔබේ පිළිතුර නෛතික අධිකාරීන් මාර්ගයෙන් තහවුරු කරන්න.

2. 2006 වසරේ දී අන්තර්ජාතික යුක්ති අධිකරණය සිය 60 වන සංවත්සරය සැමරීය. අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් ජාත්‍යන්තර නීතියට 60 වසරක් තිස්සේ කරන ලද අමිල සේවය සැමරීම පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරන ලද 'අන්තර්ජාතික නීතිය හා යුක්තිය වෙත වන්මන් අභියෝග' යන මැයෙන් යුත් දේශනයක් විශ්ව සමුළුවේ දී පැවැත්වීම සඳහා සින්බැඩ් හි විදේශ අමාත්‍ය විනෝද් කරීම් මහතාට ආරාධනයක් ලැබී ඇත. මේ දක්වා ඇති සංඛ්‍යා ලේඛන (නඩු තීරණ 92 ක් හා උපදේශාත්මක මත 25 ක් ) දෙස බැලීමේ දී අන්තර්ජාතික යුක්ති අධිකරණයේ ඇත්ත දායකත්වය පිළිබඳව කරීම් මහතා තුළ කුකුසක් හටගෙන ඇත. අන්තර්ජාතික යුක්ති අධිකරණය, එහි කාර්යක්ෂමභාවය, තවත් 60 වසරක් සඳහා කාර්යක්ෂම අන්තර්ජාතික යුක්ති අධිකරණයක් සඳහා යෝජනා හා නිර්දේශ පිළිබඳ සිය දේශනය කෙටුම්පත් කිරීම පිණිස කරීම් මහතා ඔබේ සහයෝගය පතයි

කෙටුම්පත සකස් කරන්න.

3. (අ) රාජ්‍ය විනිර්මුක්තිය යනු වාණිජ සබඳතාවන්හි වර්ධනය හේතුවෙන් බොහෝ දුරට සීමා වී ඇති සංකල්පයකි. කෙසේ වුව ද සංවේදී කරුණු (උදා. මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ) සම්බන්ධයෙන් රාජ්‍යයන්ගේ හැසිරීම සැලකිල්ලට ගැනීමේ දී මෙම සංකල්පය තවදුරටත් සීමා කළ යුතු බවට යෝජනා වී ඇත.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ආ) යමලන්තයේ දෙවන විධායක ජනාධිපතිවරයා වශයෙන් 1990 දී මාරපුත්‍ර තේරී පත් විය. යාබද දිවාලන්තයේ බෙදුම්වාදී සංවිධානයක් වන ප්‍රේත සංවිධානයට වර්ගඝාතනය සඳහා ඔහු විසින් කරන ලදැයි කියනු ලබන උපකාර සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර පීඩනය හමුවේ 1991 දී ඉල්ලා අස්වීමට ඔහුට සිදු විය. 1991 – 1994 අතරතුර කාලයේ දී ඔහු ප්‍රේත සංවිධානයේ සන්නද්ධ අංශයට බැඳී දිවාලන්තයේ ත්‍රස්ත ක්‍රියාවන්ට සහභාගී විය. 1994 දී කරන ලද කුමන්ත්‍රණයකින් පසු මාරපුත්‍ර යමලන්තයේ ජනාධිපති පදවිය යළි ලබා ගත්තේය. යමලන්තයේ ජනාධිපතිවරයා ලෙස හා සංවිධානයේ සාමාජිකයෙකු ලෙස ජනපති මාරපුත්‍ර විසින් කරන ලද අපරාධ ක්‍රියා හා ලබා දී ඇති ආධාර සම්බන්ධයෙන් ඔහුට එරෙහිව දිවාලන්තයේ මාධ්‍යවේදීන් පිරිසක් විසින් දේශීය අධිකරණයක දී නඩු පවරනු ලැබිය.

මාරපුත්‍ර ජනාධිපතිවරයාට උපදෙස් දෙන්න.

4. (අ) ශිෂ්ට ජාතීන් විසින් පිළිගන්නා සාමාන්‍ය නීති මූලධර්ම අන්තර්ජාතික නීතියේ මූලික මූලාශ්‍රයක් ලෙස අදාල කිරීම පිළිබඳව සාකච්ඡා කරන්න

(ආ) අන්තර්ජාතික විදුලි සංදේශ සංගමය විසින් 'චන්ද්‍රිකා මගින් හසු කර ගන්නා ඡායාරූප හා තොරතුරු අනවසර ලෙස භාවිත කිරීම' පිළිබඳ සමහර මූලධර්ම සංග්‍රහගත කිරීම සඳහා සම්මුතියක් කෙටුම්පත් කර ඇත. මෙම සම්මුතිය අපරානුමතිය සඳහා දැන් විවෘතව ඇති අතර සම්මුතිය පිළිගැනීම සඳහා සහභාගී වූ රාජ්‍ය 56 ක් සම්මුතිය අපරානුමත කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටිති. සම්මුතිය පිළිගැනීමේ තානාපති සමුළුවට සහභාගී නොවූ කොකෝ ජනරජය ද මෙම සම්මුතියට අත්සන් තැබීම පිළිබඳව සලකා බලමින් සිටින මුත්

එහි 10 (a) වගන්තියේ එන 'හදිසි අවස්ථාවක දී වර්ගීකරණය නොකරන ලද තොරතුරු බෙදා ගැනීම' යන ප්‍රතිපාදනය සම්බන්ධව එතරම් පැහැදිලිකින් නොසිටින අතර [10 (a) වගන්තිය] කොකෝ රාජ්‍යය කෙරෙහි 10 (a) වගන්තිය කිසිදු බැඳෙනසුලු බලපෑමක් ඇති නොකරනු ඇතැයි යන කොන්දේසිට යටත්ව සම්මුතියට අත්සන් තැබීමට තීරණය කරයි. කොකෝ රාජ්‍යයේ ස්ථාවරය සම්බන්ධයෙන් ලිලි රාජ්‍යය විරෝධය පළ කරන අතර කොකෝ රාජ්‍යයෙන් විශාල වශයෙන් විදෙස් ණය ලබා ගන්නා සෙලනිකාව කොකෝ රාජ්‍යයේ තීරණය පිළිගනී. සංවර්ධනය වෙමින් පවතින නවක රාජ්‍යයක් වන ට්‍රෝයි රාජ්‍යය 10 (a) වගන්තිය ට්‍රෝයි හා කොකෝ රාජ්‍යයන් අතර අදාල නොවනු ඇතැයි යන කොන්දේසියට යටත්ව කොකෝ රාජ්‍යයේ තීරණයට සහය පළ කරයි.

ඉහත රාජ්‍යයන් අතර සම්මුතිය අදාල වීමේ බලපෑම සාකච්ඡා කරන්න (සම්මුතියේ 29 වන වගන්තිය මගින් අපරානුමත කරනු ලබන අවස්ථාවේ දී හෝ පසු දිනයක දී සම්මුතියේ ඕනෑම වගන්තියක අදාල භාවය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් හෝ වෙනස් කිරීමක් ගොනු කිරීමට ඕනෑම රාජ්‍යයකට අවසර දෙනු ලබන බව සලකන්න) ඔබේ පිළිතුරේ දී 1969 වියානා සම්මුතියේ දක්වා ඇති රාජ්‍යයන්ගේ වගකීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

5. කිසිම සාමාජික රාජ්‍යයකට තවත් සාමාජික රාජ්‍යයකට එරෙහිව බලය යෙදීමේ පූර්වාපේක්ෂිත තර්ජනයකට එරෙහිව එම රාජ්‍යයට එරෙහිව බලය යෙදීම හෝ බලය යෙදීමට තර්ජනය කිරීමට එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 2 (4) හා 51 වගන්ති මගින් කිසිවිටෙකත් අවසර නොදේ

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න

6. විටිකෝ දිවයින වසර 35 ක අරගලයකින් පසුව වර්ජින් ජනරජයෙන් නිදහස ලබා ගන්නාය. විටිකෝහි නව රජු වන විශේෂ් තම ඔටුන්න පැළඳවීමේ උත්සවය අමතමින් විටිකෝ රාජ්‍යය සමග මිත්‍ර සබඳතා ආරම්භ කරන ලෙස සමස්ත ජාත්‍යන්තර ප්‍රජාවට විවෘත ආරාධනයක් කළේය. වර්ජින් ජනරජය විසින් විටිකෝ වෙනුවෙන් කලින් එළඹ තිබූ කුමන ආකාරයේ හෝ බැඳීමකට මින් ඉදිරියට තමන් ගරු නොකරන බව එතුමා පැවසීය. විටිකෝ විසින් ඇ. ඩො. බිලියන 5 ක මූල්‍ය වගකීම් හා වර්ජින් ජනරජය විසින් එළඹෙන ලද හා විටිකෝ විසින් දැන් ඉටු කළ යුතු වෙනත් වගකීම් පිළිබඳව එතුමා විශේෂයෙන් සඳහන් කළේය. නිදහස් අරගලයේ දී විදේශිකයන්ට හා ඔවුන්ගේ දේපලවලට සිදු වූ හානි සම්බන්ධයෙන් වන්දි ගෙවීමේ හැකියාව ඔහු විසින් බැහැර කරන ලදී. සිය දිවයින නැවත අල්ලා ගැනීමේ ප්‍රයත්නයක් වැලැක්වීම පිණිස දිවයින වටා නාවික සැතපුම් 200 ක මුහුදු සීමාව තුළ මුහුදු බෝම්බ අතුරන ලෙස එතුමා නියෝග කළේය. දින කිහිපයකට පසු විරාක් දේශයේ තම හමුදාවන්ට ආයුධ ගෙන යමින් සිටි ටයිටේනියාවේ යුධ නෞකාවක් විටිකෝ වෙරළාසන්නයේ දී මුහුදු බෝම්බවලට හසුවීම නිසා නැවේ සිටි සියලු දෙනා මිය ගියහ. වගකීම භාරගැනීම විටිකෝ ප්‍රතික්ෂේප කරයි.

ඉහත අවස්ථාවේ උද්ගත වන නෛතික ගැටලු සාකච්ඡා කරන්න.

7. "...... කිසියම් ගිවිසුමක හෝ සම්මුතියක අන්තර්ගතය 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ ලිඛිත නීතියක විධිවිධානවලට' පටහැනි වන විට ජනාධිපතිවරයා විසින් එවැනි ගිවිසුමකට එළඹීම හෝ සම්මුතියක් අනුමත කිරීම ඉහත දක්වා ඇති 33(f) ව්‍යවස්ථාවේ සීමාවන් උල්ලංඝනය කිරීමක් වන අතර බලාතික්‍රමණයක් ද වේ. ජනාධිපතිවරයාගේ එවන් ක්‍රියාවක් මගින් ජනරජයේ

තත්ත්වය බැඳීමකට ලක් නොවේ මෙම නිගමනයට තුඩුදෙක් එළඹෙන ලද්දේ ඉහත සඳහන් කරන ලද ද්විවාදයට අනුව නොවන නමුත් රාජ්‍ය බලය ක්‍රියාවේ යෙදවීම හා ස්වාධිපත්‍යයට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 හා 33 (f) ව්‍යවස්ථාවල දක්වා ඇති පරිදි එම රාජ්‍ය බලය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ සීමාවන් වෙත අවධානය යොමු කිරීමෙනි." - සරත් එන් සිල්වා අ වි 15.09. 2006 දින තීරණය කරන ලද (වාර්තා නොකරන ලද) නල්ලරත්නම් සිංහරාසා එ. නීතිපති S.C. Spl. (LA) No: 182/99 නඩුවේ දී

දේශීය නීති පද්ධති තුළ අන්තර්ජාතික නීතියේ අදාල වීම පිළිබඳ ප්‍රායෝගික තත්ත්වයන් ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මක ඇගැයීමකට ලක් කරන්න.

8. "රාජ්‍යත්වයේ ප්‍රධානතම අංග ලක්ෂණය වන 'රාජ්‍යයන්ගේ ස්වාධිපත්‍යය' නැමති සංකල්පය මිත්‍යාවක් බවට පත්ව ඇත."

අදහස් දක්වන්න

නිමිකම් ඇවිරිණි

************